# 1 ප්‍රජාතන්ත්‍රවාදී පාලනය

## 1.1 ප්‍රජාතන්ත්‍රවාදය

"ප්‍රජාව" යනු කිසියම් සමාජයක එකිනෙකා අතර අන්‍යෝන්‍ය සමීප සම්බන්ධතාවකින් හා දේශපාලන, ආර්ථික, සංස්කෘතික සබඳතාවලින් බැඳී ජීවත්වන ජනතාව ය. **"තන්ත්‍රය"** යනුවෙන් අදහස් කරන්නේ පාලන ක්‍රමයයි. ඒ අනුව **"ප්‍රජාතන්ත්‍රවාදය"** යනු ජනතාව විසින් අනුමත කොට පවත්වා ගෙන යනු ලබන පාලන ක්‍රමයක් පිළිබඳ සංකල්පයකි.

ඉංග්‍රීසි බසින් ප්‍රජාතන්ත්‍රවාදය හැඳින්වීම සඳහා භාවිත කරන **"Democracy"** යන වචනය ග්‍රීක භාෂාවේ ***"Demos"*** හා ***"Kratos"*** යන වචන දෙකෙහි එකතුවෙන් සකස් වූවකි. එම වචන දෙකෙහි තේරුම පිළිවෙළින් මහජනතාව සහ පාලනයයි. (බ්‍රිටනිකා විශ්ව කෝෂයෙහි 2004 මුද්‍රණයට අනුව) ප්‍රජාතන්ත්‍රවාදය යනු මහජනතාව විසින් කරනු ලබන පාලනයයි.

> ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක පාලකයන් තෝරාගනු ලබන්නේත් පාලකයාට බලය පවරා දෙනු ලබන්නේත් මහජනතාව විසිනි.

ප්‍රජාතන්ත්‍රවාදය විවිධ දාර්ශනිකයින් විසින් විවිධාකාරයෙන් නිර්වචනය කරන ලද සංකල්පයකි. ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ කරනු ලැබූ ජනප්‍රිය නිර්වචනයක් මෙහි දැක්වේ.

"ප්‍රජාත්‍රන්ත්‍රවාදය නිෂ්පාදනය කළ හැකි දෙයක් හෝ නිර්යාත කළ හැකි දෙයක් හෝ නො වේ. එය නිශ්චිත ව ම රැක බලා ගත යුතු හා පෝෂණය කළ යුතු දෙයකි. නියත වශයෙන් ම නිම කළා වූ ප්‍රජාතන්ත්‍රවාදයක් සැලසුම් කිරීමට සූත්‍රයක් නැත. ඒ සියල්ල කළ හැකි වන්නේ ප්‍රජාතන්ත්‍රවාදයේ බීජුවට මිනිසාගේ සිත් තුළ රෝපණය කිරීමෙනි."

***"සාමයෙන් හා සහයෝගයෙන් එක් වී ජීවත් වීමට ඉගෙනීම පිළිබඳ සමුළුව"*** UNESCO 2001 ජූලි දකුණු කොරියාවේ සියොල් නගරයේ දී.

> *"ජනතාව විසින් ජනතාව උදෙසා ගෙන යනු ලබන ජනතාවගේ පාලන ක්‍රමය ප්‍රජාතන්ත්‍රවාදී පාලනයයි."*
>
> ◆ ***ඇමරිකානු ජනාධිපති ඒබ්‍රහම් ලින්කන් 1863 ගෙටිස්බර්ග් නුවර දී.***

ජනතාවට අභිමත ලෙස සෘජු ව හා වක්‍ර ව ව්‍යවස්ථාදායක, විධායක, අධිකරණ යන ත්‍රිවිධ පාලන කාර්යයන්ට සහභාගි වීමේ බලය ව්‍යවස්ථානුකූල ව පවරා ඇති, ජනතා නිදහස, අයිතිවාසිකම් සමානාත්මතාව හා සෘජු ප්‍රජාතන්ත්‍රවාදී උපක්‍රම ව්‍යවස්ථාවට පමණක් සීමා නොකර ප්‍රායෝගික ව ම ක්‍රියාවට නැංවිය හැකි පාලන ක්‍රමය ප්‍රජාතන්ත්‍රවාදයයි.

**ක්‍රියාකාරකම් 1.1**

ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ අදහස් දක්වන 2004 බ්‍රිතාන්‍ය විශ්ව කෝෂය ඒ සම්බන්ධ ප්‍රධාන ආකෘති තුනක් දක්වයි.

i. **ඍජු ප්‍රජාතන්ත්‍රවාදය** (පුරවැසියා ඍජු ව ම පාලන කටයුතුවලට සහභාගි වන ප්‍රජාතන්ත්‍රවාදී පාලනය)

ii. **නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය** (ජනතාවගේ නියෝජිතයන් මගින් පාලනය වන ප්‍රජාතන්ත්‍රවාදී පාලනය)

iii. **නිදහස් හෙවත් ව්‍යවස්ථානුගත ප්‍රජාතන්ත්‍රවාදය** (ජනතා නියෝජිතයන් මගින් පාලනය කෙරෙන, ව්‍යවස්ථානුකූල ව සැලසුම් කර, මූලික අයිතීන් හා නන් වැදෑරුම් නිදහස තහවුරු කර ඇති පාලන ක්‍රමය.)

ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ ඉහත දක්වන ලද ආකෘති අතරින් ඍජු ප්‍රජාතන්ත්‍රවාදය ග්‍රීසියේ පැවති බව සඳහන් වේ. වර්තමානයේ ඊට සමාන ක්‍රමයක් ස්විට්සර්ලන්තයේ ප්‍රාන්ත කිහිපයක ක්‍රියාත්මක වේ.

නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය බ්‍රිතාන්‍යය, ඊශ්‍රායලය, නවසීලන්තය ආදි රටවල ක්‍රියාත්මක වේ. නිදහස් හෙවත් ව්‍යවස්ථානුගත ප්‍රජාතන්ත්‍රවාදය ඇමරිකා එක්සත් ජනපදය, ඉන්දියාව, ශ්‍රී ලංකාව වැනි රටවල ක්‍රියාත්මක වේ. මෙයින් පැහැදිලි වන්නේ ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ පිළිගත් පොදු නිර්වචනයක් ඉදිරිපත් කිරීම දුෂ්කර බවයි.

**ක්‍රියාකාරකම් 1.2**

- ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ ව ඉදිරිපත් වී ඇති විවිධ නිර්වචන එකතු කරන්න.
- ප්‍රජාතන්ත්‍රවාදය යනුවෙන් ඔබ අදහස් කරන්නේ කුමක් ද යි පැහැදිලි කරන්න.
- ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ ව නිර්වචන රාශියක් ඉදිරිපත්වීමට බලපා ඇති හේතු සාකච්ඡා කරන්න.

## 1.2 ප්‍රජාතන්ත්‍රවාදී පාලනයේ ආරම්භය හා ඉතිහාසය

ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයේ ඇතැම් ලක්ෂණ ඉතා ඈත අතීතයේ පැවති පාලන ක්‍රම තුළ ද අන්තර්ගත ව තිබුණු බවට සාධක හමු වේ. උදාහරණ වශයෙන් ඉන්දියාවේ ලිච්ඡවි රජ දරුවන්ගේ පාලන ක්‍රමය හඳුන්වා දිය හැකි ය. එම පාලන ක්‍රමය ජන සම්මතවාදී ව කටයුතු කළ බව සඳහන් වේ.

ක්‍රි.පූ. 4 වන සියවසේ පණ්ඩුකාභය රජ සමයේ දී 'ගම් පාලනය සඳහා පැවති ගම්සභා ක්‍රමය තුළ 'ගමික' නමින් හැඳින් වූ නායකයා පත් කර ගැනීමේ දී ගම්වාසීන්ගේ බහුතර කැමැත්ත විමසා තිබේ. ඊට පසු කාලයේ ද ශ්‍රී ලංකාවේ පැරණි රාජ්‍ය පාලන කටයුතුවල දී ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ තිබුණු බවට සාක්ෂ්‍ය ඇත. එකල රජවරුන් පාලනය පිළිබඳ තීරණ ගැනීමේ දී අමාත්‍ය මණ්ඩලයේ අදහස් විමසා කටයුතු කර ඇත. පාලනය පිළිබඳ සාකච්ඡා පැවැත් වූ රාජ සභා මණ්ඩපවල නටබුන් වර්තමානයේ ද දක්නට ලැබේ.

නූතන ප්‍රජාතන්ත්‍රවාදයේ නිජබිම ලෙස පිළිගනු ලබන්නේ ග්‍රීසියයි. ග්‍රීසියේ පෞර හෙවත් නගර රාජ්‍යයන්හි පාලන කටයුතු සිදුකර ඇත්තේ ප්‍රජාතන්ත්‍රවාදය අනුව ය. මෙහි දී ඇතැන්ස්, ස්පාටා වැනි නගරවල පාලන කටයුතු සම්බන්ධයෙන් නගරයේ පුරවැසියන් එක්රැස් වී තීරණ ගෙන තිබේ.



කාරියටිඩ්ස් අංගනය ඇතැන්ස් - ග්‍රීසිය

1.1



පාර්තිනන් ඇක්‍රෝපොලිස් ඇතැන්ස් - ග්‍රීසිය

1.2

## 1.3 සෘජු ප්‍රජාතන්ත්‍රවාදය හා නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය

ග්‍රීසියේ පෞර රාජ්‍යයන්හි ක්‍රියාත්මක වූයේ **සෘජු ප්‍රජාතන්ත්‍රවාදයයි.** එහි දී පාලනයට යටත්වන සියලු ම පුරවැසියන් එක් වී පාලන කටයුතු පිළිබඳ තීරණ ගෙන තිබේ.

සෘජු ප්‍රජාතන්ත්‍රවාදය වර්තමාන ලෝකයේ ක්‍රියාත්මක නොවීමට හේතු.

- වර්තමාන රාජ්‍යවල භූමිය විශාල වීම.
- ජනගහන වර්ධනයේ බලපෑම.
- සමාජය සංකීර්ණ වීම.
- පාලන කටයුතු පිළිබඳ තීරණ ගැනීමට එක්රැස්වීමේ දුෂ්කරතාව.

ප්‍රජාතන්ත්‍රවාදී රටවල වර්තමානයේ සිදුවන්නේ ජනතාවගේ කැමැත්ත විමසීම සඳහා පවත්වන මැතිවරණ ක්‍රමයක් තුළින් තෝරා පත්කර ගන්නා මහජන නියෝජිතයන් මඟින් පාලන කටයුතු පිළිබඳ තීරණ ගැනීමයි. එය **නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය** හෙවත් වක්‍ර ප්‍රජාතන්ත්‍රවාදය ලෙස හැඳින්වේ.

නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය යනු මැතිවරණයක් මගින් නියමිත කාලයක් සඳහා ජනතාවගේ බහුතර කැමැත්ත මත තෝරා පත්කර ගනු ලබන මහජන නියෝජිතයන් මගින් සිදු කරන පාලනයයි.

නියෝජන ප්‍රජාතන්ත්‍රවාදයේ දී සියලු ම ඡන්දදායකයන්ට ඍජුව ම පාලන කටයුතුවලට සහභාගි විය නොහැකි නිසා නූතන ප්‍රජාතන්ත්‍රවාදී රටවල ජනතාවට ඍජු ප්‍රජාතන්ත්‍රවාදී උපක්‍රම මගින් පාලන කටයුතුවලට සහභාගි වීමට ඉඩ සලසා ඇත.

නියෝජන ප්‍රජාතන්ත්‍රවාදයට අනුව රාජ්‍යයක පුරවැසියන් අතරින් ඡන්දබලය හිමි වන පිරිස ඡන්දදායකයන් ලෙස හැඳින්වේ.

## ක්‍රියාකාරකම් 1.3

- ශ්‍රී ලංකාවේ ඡන්දදායකයකු වීම සඳහා අවශ්‍ය සුදුසුකම් ලැයිස්තු ගත කරන්න.

**ඍජු ප්‍රජාතන්ත්‍රවාදී උපක්‍රම**

ජනමත විචාරණය **(Referendum)**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්බන්ධ කරුණක් හෝ කිසියම් නීති සම්පාදන කාර්යයක් සඳහා ජනතාවගේ කැමැත්ත අකමැත්ත විමසීම ජනමත විචාරණය ලෙස හැඳින්වේ.

ජනමත විචාරණය භාවිත කරන රටවල්: ශ්‍රී ලංකාව, ප්‍රංශය

ප්‍රාරම්භනය **(Initiative)**

කිසියම් නීතියක් ආරම්භ කිරීමට ජනතාවට ඇති හැකියාව ප්‍රාරම්භනයයි. (කිසියම් නීතියක් පනවන ලෙස ඉල්ලා සිටීම) භාවිත කරන රට: ස්විට්සර්ලන්තය

පුනරාවර්තනය **(Recall)**

ජනතාවට ඔවුන් පත් කළ දූෂිත නිලධාරීන් හෝ දේශපාලනඥයින් ආපසු කැඳවීමට හෝ තනතුරු අහෝසි කිරීමට ඇති හැකියාව පුනරාවර්තනයයි.

භාවිත කරන රට: ස්විට්සර්ලන්තය

ප්ලෙබිසයිට් ක්‍රමය : **(Plebiscite)**

මේ ක්‍රියාවලියෙන් අපේක්ෂා කරන්නේ කිසියම් දේශපාලන ප්‍රශ්නයක් නිරාකරණය කර ගැනීම සඳහා ජනතාවගේ අදහස් විමසීමයි. මෙම ක්‍රමය බහුල ව භාවිත කරනු ලබන්නේ රටවල් දෙකක් අතර භූමිය පිළිබඳ අයිතිය නිරවුල් කිරීම පිණිස ජනතා කැමැත්ත විමසීමටයි. උදා: 1935 දී ජර්මනිය සහ ප්‍රංශය යන රටවල් දෙක අතර සාර් ප්‍රදේශයේ අයිතිය සම්බන්ධයෙන් ඇති වූ ගැටලුව නිරාකරණය කරනු ලැබුවේ මෙම ක්‍රමය උපයෝගී කර ගනිමිනි.

**ක්‍රියාකාරකම් 1.4**

- ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි අන්තර්ගත සෘජු ප්‍රජාතන්ත්‍රවාදී උපක්‍රම ක්‍රියාත්මක වූ අවස්ථාවක් පිළිබඳ තොරතුරු එකතු කරන්න.

## 1.4 ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක අංග ලක්ෂණ

ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් හඳුනා ගැනීමට අවශ්‍ය අංග කිහිපයක් පහත දැක්වේ.

**i. සර්ව ජන ඡන්දබලය පදනම් කරගෙන ආණ්ඩු සහ නියෝජිතයන් තෝරා ගැනීම.**


සර්වජන ඡන්දබලය යනු නියෝජිතයින් තෝරා ගැනීමට මෙන් ම සෘජු ප්‍රජාතන්ත්‍රවාදී උපක්‍රම අනුව පාලන කටයුතුවලට සහභාගි වීමට ඡන්ද දායකයාට ඇති අයිතියයි. සර්වජන ඡන්ද බලය මගින් පිළිගැනීමට ලක්වන්නේ බහුතර කැමැත්තයි. ප්‍රජාතන්ත්‍රවාදී රටක බහුතර කැමැත්ත ප්‍රධාන සාධකයකි.

1. මැතිවරණයකින් පසු ආණ්ඩු පත්කිරීම
2. ජනතා නියෝජිතයින් පත්කිරීම
3. ව්‍යවස්ථාදායකය මගින් නීති සම්පාදනය කිරීමේ දී බහුතර කැමැත්ත පිළිබඳ විමසීමක් සිදු කිරීම.

**ii. තරඟකාරී පක්ෂ ක්‍රමයක් පැවතීම.**

ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක පැවැත්ම සඳහා අත්‍යවශ්‍ය අංගයක් වන්නේ තරඟකාරී දේශපාලන පක්ෂ ක්‍රමයයි. දේශපාලන පක්ෂයක් යනු කිසියම් ප්‍රතිපත්ති සමුදායක් පදනම් කරගෙන රටේ දේශපාලන බලය ලබාගැනීමට සංවිධානය වූ පිරිසකගේ එකතුවකි.

ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක මෙම අරමුණ ඇති ව ලියාපදිංචි වූ දේශපාලන පක්ෂවල පැවැත්මට හා ක්‍රියාකාරීත්වයට අවස්ථාව තිබිය යුතු ය.




1.3 නූතන ලෝකයේ විවිධ පක්ෂ ක්‍රම

නූතන ලෝකයේ විවිධ පක්ෂ ක්‍රම පවතිනු දැකිය හැකි ය.

තරඟකාරී පක්ෂ ක්‍රම වශයෙන් හඳුනාගත හැකි වන්නේ ද්වි පක්ෂ ක්‍රමය හා බහු පක්ෂ ක්‍රමයයි.

**iii. නිදහස් හා සාධාරණ මැතිවරණ පැවැත්වීම.**
ප්‍රජාතන්ත්‍රවාදී රටක ව්‍යවස්ථානුකූල ව නිදහස් හා සාධාරණ මැතිවරණ නියමිත කාලයට අනුව පැවැත්විය යුතු ය. පාලන කාර්යයට ජනතා සහභාගිත්වය ලබාගැනීම මෙයින් අදහස් කෙරේ.

**iv.** රට මැතිවරණ කොට්ඨාසවලට බෙදා වෙන් කිරීම.

ඡන්ද කොට්ඨාස බෙදා වෙන් කිරීම සඳහා පිළිගත් නිර්ණායක භාවිත කරමින් සීමාවන් නිර්ණය කිරීමට සීමා නිර්ණය කිරීමේ කොමිෂන් සභා තෝරා පත්කර ගනු ලැබේ.

භූමිය හා ජනගහනය මැතිවරණ කොට්ඨාස බෙදා වෙන් කිරීමේ දී සීමා නිර්ණය සඳහා කොමිෂන් සභාව විසින් අවධානයට ලක් කරන කරුණු කිහිපයකි. එනම්

1. භූමිය - එහි විශාලත්වය හා භූවිෂමතාවය
2. ජන ඝනත්වය
3. ජන සංයුතිය


**ශ්‍රී ලංකාවේ වර්තමාන මැතිවරණ දිස්ත්‍රික්ක සිතියම**




1.4

**v.** **නිදහසට අයිතිවාසිකම්වලට හා සමානාත්මතාවට ගරු කිරීම.**

ප්‍රජාතන්ත්‍රවාදයේ පදනම නිදහස, අයිතිවාසිකම් හා සමානාත්මතාවයි. රටේ ජනතාවට කිසිදු විශේෂීකරණයකින් තොර ව ඒවා ලැබිය යුතු ය. නිදහස, අයිතිවාසිකම් හා සමානාත්මතාව පිළිනොගත් රටක ප්‍රජාතන්ත්‍රවාදය නොපවතී.




1.5 ප්‍රජාතන්ත්‍රවාදයේ පදනම

**ක්‍රියාකාරකම් 1.5**

- ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂ ක්‍රමය ඉහත සඳහන් කුමන පක්ෂ ආකෘතියකට අයත් ද යි සාකච්ඡා කරන්න.

❖ **නිදහස (Liberty)**

නිදහස යනුවෙන් අදහස් කරන්නේ සෙසු සමාජ ජීවීන්ට හානියක් නොවන පරිදි තම සිතැඟි ඉටුකර ගැනීම සඳහා පුද්ගලයාට බාහිර පරිසරයෙන් ලැබෙන්නා වූ අනුග්‍රහයයි.

*මිනිසාට තම පෞද්ගලිකත්වය ආරක්ෂා කර ගෙන කටයුතු කළ හැකි පරිදි ඇතිවන පරිසරයේ ආරක්ෂා සහිත බව නිදහසයි.*

◆ *මහාචාර්ය හැරල්ඩ්. ජේ. ලැස්කි*

*බාහිර බාධකයන්ගෙන් තොර ව පුද්ගලයාට සිය පෞද්ගලිකත්වය වර්ධනය කරගැනීමට ඇති ඉඩ ප්‍රස්තාව නිදහසයි.*

◆ *ජී. ඩී. එච්. කෝල්*

## ❖ මානව අයිතිවාසිකම් (Human Rights)

> මිනිසාට සිය සමාජ ජීවිතය යහපත් අයුරින් පවත්වාගෙන යාමට අවශ්‍ය කොන්දේසි අයිතිවාසිකම් වේ.
>
> ◆ මහාචාර්ය හැරල්ඩ්. ජේ. ලැස්කි

මානව අයිතිවාසිකම් යනුවෙන් අදහස් කරන්නේ සමාජ ජීවියකු වන මිනිසාට සිය පෞද්ගලික ජීවිතය පරිපූර්ණ කරගැනීම සඳහා අවශ්‍ය වන්නා වූ කොන්දේසි සමූහයයි. අයිතිවාසිකම් පිළිබඳ ව විවිධ නිර්වචන ඉදිරිපත් වී තිබේ.

අද භුක්ති විඳින අයිතිවාසිකම්වලින් බොහොමයක් මිනිසා විසින් ඓතිහාසික විප්ලව මගින් දිනාගන්නා ලද ඒවා ය.

උදා :- ඉංග්‍රීසි විප්ලවය ක්‍රි.ව.1688
ඇමරිකන් විප්ලවය ක්‍රි.ව.1776
ප්‍රංශ විප්ලවය ක්‍රි.ව.1789
රුසියන් විප්ලවය ක්‍රි.ව.1917

විවිධ අවස්ථාවල දිනාගත් අයිතිවාසිකම් කිසිදු භේදයකින් තොර ව සමස්ත මානව වර්ගයාට ම භුක්ති විඳිය හැකි පරිදි එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් 1948 දෙසැ.10 මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය ඉදිරිපත් කරන ලදී.

| සිවිල් අයිතිවාසිකම් | දේශපාලන අයිතිවාසිකම් |
|---|---|
| ◆ සැමට ජීවත්වීමේ අයිතිය.<br>◆ නිදහස් ව සිතීමේ හා පෞද්ගලික ආරක්ෂාව සලසා ගැනීමේ අයිතිය.<br>◆ හිංසාවට හෝ අමානුෂික දඬුවමකට භාජනය නොවීමේ අයිතිය.<br>◆ අධ්‍යාපනය ලැබීමේ අයිතිය.<br>◆ රට තුළ ඕනෑ ම ප්‍රදේශයක ගමනාගමනයේ යෙදීමට හා පදිංචි වීමට ඇති අයිතිය.<br>◆ නිසි වයසට පත් සැමට සිය අභිමතය පරිදි විවාහ වීමේ අයිතිය.<br>◆ හෘද සාක්ෂියට එකඟ ව කැමති ආගමක් ඇදහීමේ අයිතිය.<br>◆ කැමති පරිදි රැකියාවක යෙදීමේ අයිතිය.<br>◆ දේපළ එක් රැස්කිරීමේ අයිතිය.<br>◆ කලාත්මක, තාක්ෂණික හා විද්‍යාත්මක නිර්මාණ කිරීමට හා එහි ඵල භුක්ති විඳීමට ඇති අයිතිය. | ◆ ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය.<br>◆ දේශපාලන පක්ෂ සංවිධානය කිරීමේ අයිතිය.<br>◆ මැතිවරණයක දී ඡන්ද අපේක්ෂකයකු ලෙස ඉදිරිපත් වීමේ අයිතිය.<br>◆ රජයේ හෝ දේශපාලන තනතුරු දැරීමේ අයිතිය.<br>◆ ආණ්ඩුව විවේචනය කිරීමේ අයිතිය. |

**යුතුකම්**

**සදාචාරාත්මක**

- සමාජය පිළිගත් සාරධර්ම අනුව ගොඩනැඟී ඇත.
- වැඩිහිටියන්ට ගරු කිරීම සමාජ සිරිත් පිළිපැදීම ඓතිහාසික සමාජ සංස්කෘතිකාංග සුරැකීම.

**නෛතික**

- ආණ්ඩුව විසින් නිර්දේශ කර ඇත.
- නීත්‍යනුකූල ව හැසිරීම නිසි පරිදි බදු ගෙවීම නීතිය සුරක්ෂිත කිරීමට සහයෝගය ලබා දීම.

**ක්‍රියාකාරකම් 1.6**

අයිතිවාසිකම් භුක්ති විඳින පුරවැසියන් තම යුතුකම් ඉටු කිරීමට ද බැඳී සිටිය යුතු ය.

- ඔබ භුක්ති විඳින අයිතිවාසිකම් 05 ක් ලියන්න. (ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය)
- ළමා අයිතිවාසිකම් කඩ වූ අවස්ථා 05 ක් පිළිබඳ තොරතුරු පුවත්පත් වාර්තා ඇසුරෙන් පන්තියට ඉදිරිපත් කරන්න.
- සදාචාරාත්මක හා නෛතික යුතුකම් තව දුරටත් ගොනු කරන්න.

### ❖ සමානාත්මතාව (Equality)

සමානාත්මතාව යනුවෙන් අදහස් කරන්නේ සමාජ ජීවියකු ලෙස මිනිසාට ලැබිය යුතු සියලු අයිතිවාසිකම්වලින් ඔහු සමානයකු වන බවයි.

> *මිනිසා උත්පත්තියේ සිට මරණය දක්වාම සමාන වූ අයිතිවාසිකම්, උරුමකොට ගන්නෙකි.*
>
> ♦ 1789 ප්‍රංශ ජාතික මණ්ඩලය

මෙයින් පැහැදිලි වන්නේ සෑම මිනිසකු ම සෑම අතින් ම එක හා සමාන නොවන අතර මිනිසුන් සමාන වන්නේ ජීවත්වීමේ අයිතිය, නිදහස හා වාසනාව සොයා යාම යන අයිතීන්වලින් බව ය. ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක නිදහස, අයිතිවාසිකම් හා සමානාත්මතාව සිවිල්, ආර්ථික දේශපාලන වශයෙන් සමාජයීය ක්‍රියාවන්හි දී සමාන ව උරුම කර ගැනීමේ අයිතිය ඇත. එහෙත් ප්‍රායෝගික ව මේ සම්බන්ධයෙන් විෂමතා පවතිනු දැකිය හැකි ය.

"සමානාත්මතාව" පිළිබඳ වඩාත් පැහැදිලි ලෙස විග්‍රහ කළ අවස්ථාවක් පහත සඳහන් වේ.

සියලු මිනිසුන් සෑම අතින් ම සමාන යැයි ප්‍රකාශ කිරීමට ඔවුන් අදහස් කර නැත. වර්ණයෙන්, ශරීර ප්‍රමාණයෙන්, බුද්ධියෙන් සුචරිත වර්ධනයෙන් හෝ සමාජයීය හැකියාවන්ගේ තත්ත්වයෙන් සියලු ම දෙනා සමාන යැයි ඔවුන් අදහස් කර නැත. මිනිසා සමාන වන්නේ අන් සතු කරගත නොහැකි සමහර අයිතිවාසිකම් සම්බන්ධයෙනි. ඒ අතර ජීවිතය, නිදහස හා වාසනාව සොයා යාම යන මේවා අඩංගු වේ.

- 1776 ඇමරිකානු නිදහස පිළිබඳ ප්‍රකාශය ලියූ කතුවරුන් පිළිබඳ ඒබ්‍රහම් ලින්කන් මහතා දැරූ අදහස්

## vi. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව කටයුතු කිරීම

ආණ්ඩුවේ ප්‍රධාන කොටස් ලෙස සැලකෙන ව්‍යවස්ථාදායකය, විධායකය හා අධිකරණය සකස් වන ආකාරය, ඒවා සතු බලතල ඒවා ක්‍රියාත්මක වන ආකාරය, එම කොටස් හා පුරවැසියන් අතර පවතින සම්බන්ධතාවේ ස්වරූපය යනාදිය පිළිබඳ මූලික සිද්ධාන්ත ඇතුළත් ලියවිල්ල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවයි.

- මහාචාර්ය අයිවර් ජෙනිංග්ස්

ඉහත දක්වා ඇත්තේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පිළිබඳ ඉදිරිපත් වී ඇති විවිධ හැඳින්වීම් අතරින් එකකි.

සෑම ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් පවතී. එය ලිඛිත හෝ ලිඛිත නොවිය හැකි ය. මෙයින් අදහස් කරන්නේ ලියැවුණු හෝ නොලියවුණු යන අර්ථය ම නො වේ. සෑම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ම ලියැවී ඇති අතර ලිඛිත නොවන යනුවෙන් අදහස් කරන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලයක් විසින් සම්පාදනය කර ව්‍යවස්ථාදායකය විසින් අනුමත කරනු ලැබූ ව්‍යවස්ථාවක් නොවීමයි. (උදා:- බ්‍රිතාන්‍යය, ඊශ්‍රායලය, නවසීලන්තය) සමස්තයක් වශයෙන් ලෝකයේ අනෙකුත් රටවල ලිඛිත ව්‍යවස්ථා දක්නට ලැබේ.

### ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක ඇතුළත් මූලික කරුණු

1. ආණ්ඩුවේ ප්‍රධාන ආයතන නිර්මාණය වී ඇති ආකාරය. (ව්‍යවස්ථාදායක, විධායක හා අධිකරණ)
2. එම ආයතනවල ක්‍රියාකාරීත්වය, බලතල සහ ආයතනික වශයෙන් පවත්වන සම්බන්ධතාවන්හි ස්වභාවය.
3. රාජ්‍යය හා පුරවැසියා අතර සම්බන්ධය.
4. පුරවැසියන්ගේ මූලික අයිතිවාසිකම්.
5. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීමට අදාළ කරුණු.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව රටක උත්තරීතර ලේඛනය වන අතර මූලික නීතිය ද වේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව නිර්මාණය කරනු ලබන්නේ ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලයක් මගිනි. එය ජනතාවගේ බහුතර කැමැත්තෙන් පත්කරනු ලැබූ ව්‍යවස්ථාදායකයේ බහුතර ඡන්දයෙන් සම්මත කෙරේ. එයින් අදහස් වන්නේ ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ද ජනතාවගේ බහුතර කැමැත්ත මත ක්‍රියාත්මක වන බවයි.

ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක ජනතා නියෝජිතයින් ද පුරවැසියන් ද සියලු ම ආයතන ද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව කටයුතු කළ යුතු ය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූල නොවන කිසිදු නීතියක් ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක පැවතිය නො හැකි ය.

**ක්‍රියාකාරකම් 1.7**

- ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ අන්තර්ගත ඉහත දක් වූ මූලික කරුණු 05 ඇතුළත් වන පරිච්ඡේද අධ්‍යයනය කරන්න.

  i. • රජයේ නාමය.
     • ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාදායකය හඳුන්වා ඇති ආකාරය සහ සාමාජිකයින් ගණන.
     • ශ්‍රී ලංකාවේ විධායකය හඳුන්වා ඇති ආකාරය.
     • ශ්‍රී ලංකාවේ අධිකරණයේ ස්වභාවය.

     පන්තියේ සාකච්ඡාවට භාජන කරන්න.

  ii. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් ශ්‍රී ලාංකික පුරවැසියන්ගේ මූලික අයිතිවාසිකම් 05 ක් ලියන්න. ඒවා කඩ වූ විට ගත හැකි ක්‍රියාමාර්ග සඳහන් කරන්න.

  iii. ගුරුතුමාගේ/ගුරුතුමියගේ මග පෙන්වීම අනුව මූලික අයිතිවාසිකම් හා මානව අයිතිවාසිකම් අතර වෙනස සාකච්ඡා කරන්න.

## 1.5 ප්‍රජාතන්ත්‍රවාදී පාලනය සාර්ථක වීමට අවශ්‍ය සාධක

1. **ජනතාවට දේශපාලන අවබෝධය තිබීම**

   දේශපාලන වශයෙන් දැනුවත් හා බුද්ධිමත් ජනතාවක් සිටින සමාජයක පාලකයන් තෝරා ගැනීම, දේශපාලන පක්ෂ ප්‍රතිපත්ති සසඳා බැලීම, දූෂිත දේශපාලකයින් හා නිලධාරීන් ආපසු කැඳවීමේ අයිතිය නිවැරදි ව තේරුම් ගැනීම, සර්වජන ඡන්ද බලය උපරිම ඵල ලැබෙන අයුරින් භාවිත කිරීම ආදි ක්‍රියාදාමයන් සාර්ථක ලෙස සිදු වේ. එමෙන් ම දේශපාලන ප්‍රචණ්ඩත්වය, පදනම් විරහිත මතිමතාන්තර, දූෂණ හා වංචා ආදියට ඉඩ නොලැබේ. ප්‍රබල සිවිල් සමාජයක් ගොඩ නැගීමට ජනතාවගේ පුළුල් දේශපාලන අවබෝධය ද වැදගත් වේ.

2. ආදර්ශවත් හා උදාර නායකත්වය

දේශපාලන නායකයන් පටු ආකල්පවලින් තොර ව පොදු යහපත පතා කැපවීමෙන් කටයුතු කිරීම මෙයින් අදහස් කෙරේ. වගකීමෙන් හා වගවීමෙන් යුතු ව පාලන කාර්යය මෙහෙයවීමට හැකි නායකත්වයක් රටක ඉදිරි ගමන සඳහා අවශ්‍ය වේ.

3. දියුණු ආර්ථිකයක් පැවතීම

ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක පැවැත්ම සඳහා දියුණු ආර්ථිකයක් පැවතිය යුතු ය. නිදහස, අයිතිවාසිකම් හා සමානාත්මතාව සුරක්ෂිත කිරීම, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව කටයුතු කිරීම ආදි ක්‍රියාවන් සඳහා දියුණු ආර්ථිකයක් පැවතීම අවශ්‍ය වේ.

මූලික මිනිස් අවශ්‍යතා ඉටු නොවන රටක ප්‍රජාතන්ත්‍රවාදයට ද පැවැත්මක් නැත.

4. තරඟකාරී පක්ෂ ක්‍රමයක් පැවතීම

- ප්‍රබල ආණ්ඩු පක්ෂයක් හා ප්‍රබල විපක්ෂයක් පැවතීම.
- සර්වජන ඡන්දබලය කාර්යක්ෂම ලෙස භාවිත කිරීමට හැකි වීම
- පක්ෂ සංවිධානය වඩාත් විධිමත් වීම
- උපරිම ජනතා සේවය

යන කරුණු තරඟකාරී පක්ෂ ක්‍රමයක් තුළින් තහවුරු කළ හැකි ය.

5. බහුතර කැමැත්ත පිළිගැනීම හා සුළුතරය මර්දනය නොකිරීම

ප්‍රජාතන්ත්‍රවාදය ප්‍රජාවගේ පාලනය වන නිසා එහි මූලික ම ලක්ෂණය වන්නේ බහුතරයට පාලනය භාර දීමයි. මෙයින් සුළුතරය යටපත් කිරීම හෝ මර්දනය කිරීම සිදු නො වේ. එහි දී සුළුතරයේ මතයට සවන් දීම හා සාකච්ඡා පැවැත්වීම ප්‍රජාතන්ත්‍රවාදයේ ප්‍රධාන ලක්ෂණයකි. බහුතර මතය සකස් වීමේ දී සාකච්ඡාවට මුල් තැන හිමිවන අතර විවිධ මත, සාකච්ඡාවට භාජන කිරීමෙන් අනතුරු ව බහුතර මතය බිහි වේ.

- සියලු ම මැතිවරණවල දී ජනතාවගේ බහුතර කැමැත්තට අනුව පාලකයින් තෝරා ගැනීම.
- ව්‍යවස්ථාදායකය තුළ දී බහුතර කැමැත්ත අනුව සියලු අණ පනත් හා කෙටුම්පත් සම්මත කිරීම.
- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, නීති සංශෝධන කටයුතු හා දේශපාලන තීන්දු ගැනීමේ දී බහුතර කැමැත්ත පිළිගැනීම.
- ඍජු ප්‍රජාතන්ත්‍රවාදී උපක්‍රමවල දී බහුතර කැමැත්තට ඉඩ දීම.

6. නිදහස් ජනමාධ්‍ය පැවතීම

ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක ජනතාවට තම අදහස් ප්‍රකාශ කිරීමට මෙන් ම වෙනත් අයගේ අදහස් හා තොරතුරු දැනගැනීමට ඇති අයිතිය ද පිළිගනු ලබයි. ඒ අනුව රටේ උද්ගත වන හදිසි අවස්ථාවක දී හැර අන් සෑම අවස්ථාවක දී ම මෙම අයිතිය තහවුරු කිරීම ප්‍රජාතන්ත්‍රවාදයේ ප්‍රධාන ලක්ෂණයකි. එම අයිතීන් ජනතාවට නොලැබෙන අවස්ථාවක ඒ සම්බන්ධයෙන් අධිකරණයේ පිහිට පැතීමට ද හැකි වේ.

නිදහස් මාධ්‍ය ක්‍රියාත්මක වීමේ දී,

- නිර්මාණකරණය (සිනමා, වේදිකා නාට්‍ය, නවකථා, කෙටි කථා ආදිය)
- ලොව විවිධ තොරතුරු දැන ගැනීම හා සම්භාව්‍ය නිර්මාණ රසවිඳීම, ඇගයීම.
- මානව සිතුම් පැතුම් හා ක්‍රියාකාරකම් පිළිබඳ පර්යේෂණ පැවැත්වීම.
- මහජන මතය ගොඩනැගීම.

සඳහා අවස්ථාව උදාවේ.

**මහජන මතය යනු කිසියම් සුවිශේෂී කරුණක් පිළිබඳ ව රටේ ජනතාවගෙන් සැලකිය යුතු පිරිසකගේ පුද්ගල මතවාද හා විශ්වාස ඒකීය වශයෙන් ප්‍රකාශයට පත් වීමයි.**

ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක රාජ්‍ය බලය ජනතාව විසින් ප්‍රකාශ කරනු ලබන නිදහස් අදහස් හා කැමැත්ත මගින් මෙහෙයවනු ලබයි. පුවත්පත්, ගුවන් විදුලිය, රූපවාහිනිය, පොත් පත්, සඟරා අන්තර්ජාලය ඇතුළු විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය මගින් ඉදිරිපත් කෙරෙන රාජ්‍යයේ කාර්යන් පිළිබඳ ව මහජනතාව, දේශපාලන පක්ෂ, වෘත්තීය සමිති, ආගමික සංවිධාන තම විවේචන හා සංශෝධන ගෙන හැර දක්වති. එහි දී රාජ්‍යය, මහජන මතය අනුව කටයුතු කිරීමට නැඹුරු වේ.

නිදහස් මාධ්‍ය භාවිත කරමින් තොරතුරු ලබාගැනීමේ දී හා මාධ්‍යය වෙත තොරතුරු ඉදිරිපත් කිරීමේ දී මාධ්‍ය ආයතනය මෙන් ම මහජනතාව ද එකී තොරතුරුවල සත්‍යතාව හා නිවැරදි බව සම්බන්ධයෙන් වගකීම් සහගත ව කටයුතු කිරීම රටක ප්‍රජාතන්ත්‍රවාදය සුරක්ෂිත කිරීමට අත්‍යවශ්‍ය සාධකයකි.

7. නීතියේ ආධිපත්‍යය හා අධිකරණයේ ස්වාධීනතාව තහවුරු කිරීම

ශිෂ්ට ලෝකයේ නීතිය ක්‍රියාත්මක වීමේ දී පාලකයාට එක් නීතියක් ද පාලිතයාට තව නීතියක් ද ක්‍රියාත්මක නො වේ. පාලක පාලිත දෙපක්ෂයට ම එක ම නීතියක් ක්‍රියාත්මක වන අතර එම නීතිය කඩ කිරීම එක සේ දඬුවම් ලැබිය හැකි වරදකි. එනම් කිසිදු භේදයකින් තොර ව නීතිය ක්‍රියාත්මක වීම අපේක්ෂා කෙරේ.

නීතියට අනුව පාලනය කිරීම නීතියේ ආධිපත්‍යය වේ.

8. මහජන සුභසාධනයට මූලිකත්වය දීම

ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක ප්‍රධාන අරමුණ ජනතා සේවයයි. ඒ අනුව රටේ ජනතාවට යහපත් ජීවිතයක් ගතකිරීම සඳහා අවශ්‍ය පහසුකම් සම්පාදනයට මැදිහත් වීම ද එහි කාර්යයකි. දිළිඳුකම තුරන්කිරීම ස්වාභාවික හා හදිසි ආපදා අවස්ථාවල දී සහන සැලසීම ඇතුළු සුබ සාධන කටයුතු පවත්වාගෙන යාම ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක දක්නට ලැබේ.

### ක්‍රියාකාරකම් 1.8

1. ප්‍රජාතන්ත්‍රවාදී රටවල නීති කඩ කළ අවස්ථාවල දී පාලකයාට/පාලිතයාට වෙනසක් නැති ව දඬුවම් ලැබුණු අවස්ථා පිළිබඳ තොරතුරු රැස්කරන්න.
2. ප්‍රජාතන්ත්‍රවාදී රටක පවතින නිදහස තුළ සන්නිවේදන මාධ්‍ය අයථා ලෙස භාවිත කිරීමෙන් ඇතිවිය හැකි හානිදායක ප්‍රතිඵල සාකච්ඡා කරන්න.
3. "ප්‍රජාතන්ත්‍රවාදයට අනුව තීරණ ගැනීමේ දී වඩාත් සුදුසු වන්නේ සාකච්ඡා මාර්ගයයි."

   අප රටේ තීරණ ගැනීම සඳහා මෙම ක්‍රමවේදය භාවිත කරන අවස්ථා පිළිබඳ ලැයිස්තුවක් ගුරුතුමාගේ/ගුරුතුමියගේ උපදෙස් මත සකස් කරන්න.

## 1.6 රාජ්‍යයේ හා ආණ්ඩුවේ ස්වභාවය

අප ජීවත් වන්නේ රාජ්‍යය තුළ ය. රාජ්‍යයෙන් තොර වූ ශිෂ්ට මානව සමාජයක් අද දැකිය නොහැකි ය. ඒ අනුව සෑම පුද්ගලයෙක් ම රාජ්‍යයේ පාලනයට යටත් ව ජීවත් වේ.

රාජ්‍යයේ පාලන කටයුතු මෙහෙයවන්නේ ආණ්ඩුවයි. ප්‍රජාතන්ත්‍රවාදයට අනුව කලින් කලට ජනතාව සිය බහුතර කැමැත්ත අනුව තමන් පාලනය කිරීම සඳහා සුදුසු ආණ්ඩුවක් තෝරා ගනිති.


රාජ්‍යය හා ආණ්ඩුව යනු ආයතන දෙකකි.

*රාජ්‍යයේ හෝ ජනතාවගේ කැමැත්ත ප්‍රතිපත්තිවලට හැරවීමත් ඒවා ක්‍රියාවට නැංවීමත් කරනු ලබන නියෝජිතයා ආණ්ඩුව වේ.*

◆ *මහාචාර්ය ගානර්*

*වෙන් කරන ලද භූමි ප්‍රදේශයක් තුළ අනෙක් සමාජ සංවිධාන ඉක්මවා ගිය උත්තරීතර බලයක් සහිත මිනිස් සමාජය රාජ්‍යය වේ.*

- *මහාචාර්ය හැරල්ඩ්. ජේ.ලැස්කි*




මේ සටහන අනුව රාජ්‍යයක් යනු අංග සතරකින් යුතු ස්ථාවර ආයතනයක් බව ඔබට වැටහෙනු ඇත.

- භූමිය
- ජනගහනය
- ආණ්ඩුව
- ස්වාධිපත්‍ය - රාජ්‍යයක ප්‍රධාන අංග වේ.

ආණ්ඩුව යනු ත්‍රිවිධ ආයතනයන්ගෙන් යුත් අස්ථාවර සංවිධානයකි. ආණ්ඩුවක් දේශපාලන, පරිපාලන හා නීතිමය ලෙස විශේෂ ප්‍රාගුණ්‍යයක් ඇති කණ්ඩායම්වලින් සැදුම්ලත් ඒකකයකි.

## (අ) ජාතික රාජ්‍යය

ජාතික රාජ්‍යයක් යනු කිසියම් ප්‍රදේශයකට අයත් ජන කොටසක් තමන්ට ආවේණික වූ සංස්කෘතික, භාෂාමය හා ආගමික විශේෂතා පදනම් කරගෙන පිහිටුවාගත් සංවිධානයකි. එමෙන් ම එම සංවිධානයට ලෝකයේ සෙසු රාජ්‍යවල පිළිගැනීම ද අවශ්‍ය වේ.

ජාතික රාජ්‍යයේ ආරම්භය 15 වන සියවසෙන් පසු සිදු වූ බව පිළිගනී. ප්‍රථමයෙන් ම බිහි වූ ජාතික රාජ්‍යයන් වූයේ බ්‍රිතාන්‍යය හා ප්‍රංශයයි. අනතුරු ව ජර්මනිය හා ඉතාලිය ජාතික රාජ්‍යයන් ලෙස වර්ධනය විය. එතැන් පටන් 20 වන සියවස වන විට ලොව පුරා ජාතික රාජ්‍ය රැසක් බිහි විය.

ජාතික රාජ්‍ය නිර්මාණයේ දී බලපෑ හේතු සාධක අතර

- ක්‍රිස්තියානි ආගමික ප්‍රතිසංස්කරණ
- විද්‍යා පුනරුදය
- වැඩවසම් ක්‍රමයේ බිඳවැටීම
- කාර්මික විප්ලවය


- ධනවාදයේ නැගීම වැනි කරුණු වැදගත් සේ සැලකේ.

ජාතික රාජ්‍යයක් ලෙස නැඟී සිටීමට හේතු වූ සුවිශේෂ කරුණු ලෙස

- ජාතික ඒකාග්‍රතාව
- යුධ හා නාවික ශක්තිය
- දියුණු ආර්ථිකය
- ජාතීන්ගේ නිර්මාණශීලී හැකියාව සඳහන් කළ හැකි ය.

බ්‍රිතාන්‍යය, පෘතුගාලය, ඕලන්දය, ප්‍රංශය වැනි රටවල් ලෝකය හමුවේ ප්‍රබල ජාතික රාජ්‍යයන් ලෙස නැඟී සිටීමට හේතු වූයේ ඉහත සඳහන් සාධකයි.

ජාතික රාජ්‍යයන් නිර්මාණයේ දී පසු කළ වර්ධන අවස්ථා නූතන සමාජ විද්‍යාඥයින් මේ ආකාරයට ඉදිරිපත් කර ඇත.




"එක් ජාතියකට එක් රාජ්‍යයක්" යන සංකල්පය මූලික වීමෙන් ජාතික රාජ්‍යය බිහි විය.

නූතන ජාතික රාජ්‍යය අවුරුදු දහස් ගණනක් තුළ විවිධ ප්‍රදේශ, ජාතීන්, ආගම් හා භාෂා කථා කරන්නවුන් එක්රැස්වීමෙන් සිදු වූ විකාශනාත්මක ක්‍රියාවලියක ප්‍රතිඵලයකි.

මෙසේ විකාශය වූ ජාතික රාජ්‍යයන්ගේ විවිධ ස්වරූප දැකිය හැකි ය. ඒ අතර ඒකීය හා සන්ධීය රාජ්‍ය ප්‍රධාන තැනක් ගනී.

## (ආ) ඒකීය රාජ්‍යය හා සන්ධීය රාජ්‍යය

ලොව පවත්නා සියලු රාජ්‍යයන් වෙන්කර හඳුනා ගැනීමේ දී ඒකීය හෝ සන්ධීය වශයෙන් බෙදා දැක්වීම වඩාත් ප්‍රායෝගික වේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් බලය බෙදා ඇති ආකාරය අනුව රාජ්‍යයන් ඒකීය හෝ සන්ධීය යනුවෙන් වර්ග කළ හැකි ය.

### ඒකීය රාජ්‍යය

තනි ආණ්ඩුවක් මගින් කිසියම් රටක අභ්‍යන්තර හා බාහිර කටයුතු සියල්ල මෙහෙයවන ආකාරයට ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව සම්පාදනය කර ඇත්නම් එම රාජ්‍යය ඒකීය රාජ්‍යයකි.

*සෑම ආකාරයක ම අධිකාරී බලය එක් මධ්‍යම බල ආයතනයක් වෙත ඒකරාශීකර ඇති ආණ්ඩු ක්‍රමය ඒකීය ආණ්ඩු ක්‍රමය නම් වේ.*

◆ *මහාචාර්ය හර්මන් ෆයිනර්*

### සන්ධීය රාජ්‍යය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් පෙන්වා දෙන ප්‍රධාන කාර්යයන් මධ්‍යම ආණ්ඩුව මගින් ඉටු කරන අතර ව්‍යවස්ථාවට අනුකූල ව තම අභ්‍යන්තර කටයුතු තමන් විසින් ම කරනු ලබන ප්‍රාන්ත රාජ්‍යයන් රැසකින් යුතු ආණ්ඩුක්‍රමය සන්ධීය ආණ්ඩුක්‍රමයකි.

*ස්වකීය බල ක්ෂේත්‍ර තුළ ස්වාධීන ව ක්‍රියාකරන නමුත් සමහර කරුණු සම්බන්ධයෙන් එක්සත් ව ක්‍රියාකිරීමට මග පාදන උපාය මාර්ගයන් සහිත ආණ්ඩුක්‍රමය සන්ධීය ආණ්ඩුක්‍රමයකි.*

◆ *කේ. සී.. වියර්*

## (ඇ) ආණ්ඩුවේ ප්‍රධාන කොටස් හා ඒවායේ ක්‍රියාකාරිත්වය

ආණ්ඩුව යනු ව්‍යවස්ථාදායක, විධායක හා අධිකරණ යන ආයතන තුනෙන් සැදුම්ලත් අතර රාජ්‍ය බලය ක්‍රියාවට නංවන අංශයයි.

❖ **ව්‍යවස්ථාදායකය**

රටක නීති සම්පාදනය ව්‍යවස්ථාදායකය මගින් සිදු කරයි. නිශ්චිත කාලයක් සඳහා මහජන ඡන්දයෙන් තෝරා පත්කර ගන්නා ව්‍යවස්ථාදායකයේ ස්වරූපය විවිධාකාර ය. එමෙන් ම එක් එක් රටවල ව්‍යවස්ථාදායකයන් විවිධ නාමයන්ගෙන් හඳුන්වනු ලැබේ.

| රට | ද්වි මාණ්ඩලික | ඒක මාණ්ඩලික | නාමය |
|---|---|---|---|
| ඇමරිකා එක්සත් ජනපදය | ✓ | | කොංග්‍රස් මණ්ඩලය |
| බ්‍රිතාන්‍යය | ✓ | | පාර්ලිමේන්තුව |
| ඉන්දියාව | ✓ | | පාර්ලිමේන්තුව |
| ලංකාව | | ✓ | පාර්ලිමේන්තුව |



1.6 ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

### ❖ විධායකය

ව්‍යවස්ථාදායකය පනවන නීති ක්‍රියාවට නංවන ආයතනය විධායකය ලෙස හැඳින්වේ.

විධායකය පත්වන ආකාර 02 කි.

1. ඍජුව ම මහජන ඡන්දයෙන් තෝරා ගැනීම.
2. පාර්ලිමේන්තුවේ බහුතර බලය හිමි පක්ෂය විසින් තෝරා ගැනීම.

විධායකය විවිධ ස්වරූපයෙන් ක්‍රියාත්මක වේ.

| රට | පත්වන ආකාරය | නිල කාලය | නාමය |
|---|---|---|---|
| ඇමරිකා එක්සත් ජනපදය | ජනාධිපතිවරණයෙන් | අවු.04 | ජනාධිපති |
| ප්‍රංශය | ජනාධිපති ජනාධිපතිවරණයෙන් ද කැබිනට් මණ්ඩලය ජාතික සභාව හා රාජ්‍ය සේවය මගින් ද | අවු.05 | ජනාධිපති |
| බ්‍රිතාන්‍යය | පාර්ලිමේන්තුවේ බහුතර බලය හිමි පක්ෂය මගින් | අවු.05 | අගමැති ප්‍රමුඛ කැබිනට් මණ්ඩලය |
| ශ්‍රී ලංකාව | ජනාධිපති ජනාධිපතිවරණය මගින් ද කැබිනට් මණ්ඩලය පාර්ලිමේන්තුව තුළින් ද | අවු.06 | ජනාධිපති ප්‍රමුඛ කැබිනට් මණ්ඩලය |



1.7 ශ්‍රී ලංකාවේ පැරණි පාර්ලිමේන්තු ගොඩනැගිල්ල වර්තමානයේ ජනාධිපති ලේකම් කාර්යාලය ලෙස පවත්වාගෙන යයි.

- ❖ **අධිකරණය**

ප්‍රජාතන්ත්‍රවාදයේ පදනම පුද්ගල නිදහසයි. පුද්ගල නිදහස රඳා පවතින්නේ අධිකරණයේ ස්වාධීනත්වය කේන්ද්‍ර කර ගැනීමෙනි. ව්‍යවස්ථාදායකය විසින් පනවනු ලැබීමෙන් අනතුරු ව විධායකය විසින් ක්‍රියාත්මක කරනු ලබන නීති, විවරණය කරනු ලබන්නේ අධිකරණය විසිනි. එමෙන් ම රාජ්‍යය තුළ උද්ගත වන විවිධ ස්වරූපයේ ගැටුම් නිරාකරණය කරමින් යුක්තිය පසිඳලීමේ කාර්යය අධිකරණය විසින් ඉටුකරනු ලබයි. රාජ්‍යයක් තුළ පැවතිය හැකි ගැටුම් පහත දැක්වේ.

- පුරවැසියන් හා පුරවැසියන් අතර ගැටුම්.
- පුරවැසියන් හා සංවිධාන අතර ගැටුම්.
- පුරවැසියන් හා රාජ්‍යය අතර ගැටුම්.
- රාජ්‍යය හා සංවිධාන අතර ගැටුම්.

ආණ්ඩුවේ ත්‍රිවිධ ආයතනයන්ගේ බලතල ක්‍රියාත්මක වීමේ දී විවිධ ස්වරූප දක්නට ලැබේ.

උදා:-

*1. බ්‍රිතාන්‍යය*

ව්‍යවස්ථාදායක, විධායක හා අධිකරණ යනුවෙන් බලතල තුන ආයතන තුනකට පවරා ඇති නමුත් ප්‍රායෝගික ක්ෂේත්‍රයේ දී එම බලතල සියල්ල සියුම් ලෙස ව්‍යවස්ථාදායකයට හෙවත් පාර්ලිමේන්තුවට යටත් කර තිබේ.

*2. ඇමරිකා එක්සත් ජනපදය*

ව්‍යවස්ථාදායක, විධායක හා අධිකරණ යනුවෙන් බලතල තුන වෙන ම ආයතන තුනකට පවරා ඇති අතර එක් එක් ආයතනයට තම ක්ෂේත්‍රය තුළ ස්වාධීන ව කටයුතු කිරීමේ අවස්ථාව පවතී.

*3. ශ්‍රී ලංකාව*

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් මෙම බලතල ව්‍යවස්ථාදායකය වන පාර්ලිමේන්තුවට පවරා තිබුණ ද එය යම් ආකාරයක පාලනයකට යටත් කිරීමේ හැකියාව ජනාධිපතිවරයාට හෙවත් විධායකයට පවරා තිබේ. (උදා :- පාර්ලිමේන්තුව විසුරුවා හැරීම, පාර්ලිමේන්තු කෙටුම්පත් ජනමත විචාරණයට යොමු කිරීම)

**මහජන නිදහස ආරක්ෂා වීමට නම් මෙම එක් එක් අංශයට තම බලතල ස්වාධීන ව ක්‍රියාත්මක කිරීමට අවස්ථාව ලබා දිය යුතු ය.**

## 1.7 ආණ්ඩුවල ස්වරූප

ආණ්ඩුක්‍රමවල විවිධ ස්වරූප පවතින අතර පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමය හා ජනාධිපති ආණ්ඩුක්‍රමය ප්‍රධාන වේ.

### (අ) පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමය

මහජනතාව විසින් නිශ්චිත කාලයක් සඳහා පත්කෙරෙන නියෝජිතයන්ගෙන් සමන්විත පාර්ලිමේන්තුවක් තුළින් නිර්මාණය වන විධායකයක් හා එම විධායකය විසින් පාර්ලිමේන්තුවේ අධීක්ෂණය යටතේ පත්කෙරෙන අධිකරණයක් මගින් අධිකරණ කටයුතු ක්‍රියාත්මක කරන ආණ්ඩුක්‍රමයක් පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයක් ලෙස හැඳින්වේ.

පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයක ප්‍රධාන ලක්ෂණ කිහිපයක් මෙසේ ය.

- ද්විත්ව විධායකය.
    - i. නාමමාත්‍ර විධායකය.
    - ii. දේශපාලන විධායකය. (සත්‍ය විධායකය)
- ව්‍යවස්ථාදායකය තුළින් විධායකය උපත ලැබීම.
- අගමැති විසින් අමාත්‍ය මණ්ඩලය සහ කැබිනට් මණ්ඩලය පත් කරනු ලැබීම.
- සාමූහික වගකීමේ ප්‍රතිපත්තිය ගරු කිරීම.
- පාර්ලිමේන්තු විසුරුවා හැරීමේ බලය අගමැති සතු වීම.
- විරුද්ධ පක්ෂය වැදගත් අංගයක් වීම.
- දේශපාලන පක්ෂ ක්‍රමයක් අත්‍යවශ්‍ය වීම.

*සත්‍ය විධායකය වන කැබිනට් මණ්ඩලය ඇතුළු අමාත්‍ය මණ්ඩලය නීත්‍යානුකූල ව පාර්ලිමේන්තුවට වගකීමට බැඳී ඇති අතර රාජ්‍ය නායකයා නාමික විධායකය වගකීමෙන් බැහැර ව සිටින ආණ්ඩුක්‍රමය කැබිනට් හෙවත් පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමය වේ.*

◆ *මහාචාර්ය ගානර්*

### ක්‍රියාකාරකම් 1.9

- ඉන්දියාව, ඕස්ට්‍රේලියාව, බ්‍රිතාන්‍යය යන රාජ්‍යවල ආණ්ඩුක්‍රම යටතේ නාමමාත්‍ර විධායකය හඳුන්වන නාමයන් ලියන්න.

**(ආ) ජනාධිපති ආණ්ඩුක්‍රමය**

විධායකය, ව්‍යවස්ථාදායකය තුළින් නිර්මාණය නොවන අතර තමන් සතු බලතල ස්වාධීන ව භුක්ති විඳින ආණ්ඩුක්‍රමයක් ජනාධිපති ආණ්ඩුක්‍රමයක් ලෙස හැඳින්වේ.

ජනාධිපති ආණ්ඩුක්‍රමයක විශේෂ ලක්ෂණ කිහිපයක් පහත දක්වේ.

- තනි විධායකය.
- විධායකය පත්වන්නේ ඒ වෙනුවෙන් ම පවත්වන සෘජු මහජන ඡන්දයකිනි.
- බලතල බෙදීම ක්‍රියාත්මක වේ.
- විධායකය ස්ථාවර වීම.
- විධායකය, ව්‍යවස්ථාදායකයට වගකීමට බැඳීමක් නොවීම.

විවිධ වෙනස්කම් සහිත ජනාධිපති ආණ්ඩුක්‍රම පවතී.

*සියලු විධායක බලතල ජනාධිපති වෙත ඒකරාශී කරන ලද, ව්‍යවස්ථාව මගින් ජනාධිපති ව්‍යවස්ථාදායකයේ බලපෑමෙන් නිදහස් කරන ලද, තම ප්‍රතිපත්ති සම්බන්ධයෙන් ව්‍යවස්ථාදායකයට වග නොකියන, තමාගේ ම ස්වාධීන පැවැත්මක් සහිත ආණ්ඩුක්‍රමය ජනාධිපති ආණ්ඩුක්‍රමය වේ.*

◆ *මහාචාර්ය ගානර්*

| පාර්ලිමේන්තු විධායක | ජනාධිපති විධායක |
|---|---|
| ◆ පාර්ලිමේන්තුවේ බහුතර බලය දිනාගත් පක්ෂයේ නායකයා අගමැති ලෙස පත් වේ. | ◆ ජනාධිපතිවරණයකින් තේරී පත් වේ. |
| ◆ ව්‍යවස්ථාදායකයට සාමූහික ව හා පෞද්ගලික ව වගකීමට බැඳී සිටී. | ◆ ව්‍යවස්ථාදායකයට වගකීමට බැඳී නො සිටී. ව්‍යවස්ථාදායකයට පරිබාහිර උපදේශක මණ්ඩලයකින් උපදෙස් ලබයි. |
| ◆ නාමික විධායකය හා සත්‍ය විධායකය ලෙස ආකාර දෙකකි. | ◆ තනි විධායකයක් පවතී. |
| ◆ ප්‍රායෝගික ව බලතල බෙදීම ක්‍රියාත්මක වීම අඩු මට්ටමක පවතී. | ◆ බලතල පැහැදිලි ලෙස බෙදා වෙන්කර තිබේ. |
| ◆ පාර්ලිමේන්තුවේ බලය ඉස්මතු වේ. | ◆ නිශ්චිත කාලයක් සඳහා ජනාධිපති ස්ථාවර ලෙස බලය භුක්ති විඳී. |

## 1.8 රාජ්‍යයේ භූමිකාව

කලින් කල ඇති වූ සමාජයීය වෙනස්කම් මත රාජ්‍යයේ භූමිකාව වෙනස් ව ඇත. ප්‍රජාතන්ත්‍රවාදී අදහස් නිර්මාණයේ පුරෝගාමියෙකු වූ තෝමස් හොබ්ස් (1588 - 1679) ප්‍රකාශ කළේ "රාජ්‍යය විසින් ලබාදෙන ආරක්ෂාව නොමැති ව මිනිසාට කිසිදු ආකාරයක ආර්ථික හෝ සමාජ ප්‍රගතියක් අත් කරගත නොහැකි ය." යනුවෙනි. ඒ අනුව මුල් යුගයේ රාජ්‍යයේ භූමිකාව ලෙස පිළිගනු ලැබුවේ, නීතිය හා සාමය ආරක්ෂා කිරීමයි. මේ ආකාරයට රාජ්‍යය වෙත පොලිස් නිලධාරියකුගේ කාර්යය පවරා අදහස් දැක්වූ දේශපාලන චින්තකයින් අතර තෝමස් හොබ්ස්, ජෝන් ලොක් (1532-1704 ක්‍රි.ව) ජීන් ජැක්වින් රූසෝ (1712-1788 ක්‍රි.ව.) වැනි චින්තකයින් හඳුනාගත හැකි ය. ඔවුන් ඉදිරිපත් කළ මතවාදය "පැරණි ලිබරල්වාදය" ලෙස හඳුන්වයි. පැරණි ලිබරල්වාදයේ ආර්ථික දර්ශනය රාජ්‍ය නිර්බාධවාදය ලෙස පිළිගනී.

**වැඩවසම් රාජ්‍ය ක්‍රමය ධනපති ක්‍රමය බවට පරිවර්තනය වෙමින් පැවති යුගයේ ධනපති ක්‍රමයට එරෙහි ව පැවති බාධකයන් ඉවත් කිරීමට ඉදිරිපත් කළ දර්ශනය පැරණි ලිබරල්වාදයයි.**

පැරණි ලිබරල්වාදී අදහස් නිසා ධනපති ක්‍රමය සවිමත් වූ අතර පීඩිත පන්තියෙන් උපරිම මෙහෙය ගැනීමට ඔවුන්ට නිදහස ලැබුණි.

ධනපති ක්‍රමයේ දැඩි සූරාකෑමට ලක්වූ පීඩිතයින්ගේ ජීවන තත්ත්වය දිනෙන් දින පිරිහුණු අතර ආගමික හා දේශපාලන වශයෙන් ඊට එරෙහි ව විරෝධතාවන් මතු වූ බව පෙනේ. එහි ප්‍රතිඵලයක් ලෙස නූතන ලිබරල්වාදය බිහි විය.

නූතන ලිබරල්වාදී අදහස් ඉදිරිපත් කළ චින්තකයින් අතර එල්. ටී. හොබ්හවුස්, ටී. එච්. ග්‍රීන්, මැක් අයිවර්, තෝමස් ජෙෆර්සන් ප්‍රධාන වේ. බ්‍රිතාන්‍යයේ විලියම් බෙවර්ජ් සාමි (1943) ඉදිරිපත් කළ වාර්තාවකින් රාජ්‍යය තුළ පවතින නූගත්කම, බෙබදුකම, දිළිඳුකම තුරන්කිරීම සඳහා සුභසාධනවාදී කටයුතුවල නිරත විය යුතු බව ප්‍රකාශ කළේ ය. නූතන ලිබරල්වාදයෙන් අදහස් කළේ කාර්මික ධනවාදය හමුවේ දුර්වල වෙමින් සිටි ජනතාව සුභසාධනය මඟින් කිසියම් ප්‍රමාණයකට වෙළෙඳපොළ වෙත යොමු කිරීමයි.

**කාර්මික ධනවාදයේ නැඟී සිටීමත් සමඟ පීඩනයට පත් වූ ජනතාව, ව්‍යවසායක පන්තියෙන් අයකරන බදු මුදලින් සුභසාධනය කළ යුතු යැයි යෝජනා කිරීමට ඉදිරිපත් වූ දේශපාලන මතවාදය නූතන ලිබරල්වාදයයි.**

සුභසාධනවාදී ආර්ථික බලපෑම් හමුවේ වර්ධනය වෙමින් පැවති රාජ්‍ය අංශය නිසා හැකිලෙමින් පැවති පෞද්ගලික අංශය හා නිදහස් වෙළෙඳපොළ ආර්ථිකය නැවත නඟා සිටුවීමේ අදහසින් ඉදිරිපත් කළ දර්ශනය නව ලිබරල්වාදයයි. මෙම අදහස ඉදිරිපත් කළවුන් අතර පොඩ්‍රිච් හයෙක්, මිල්ටන් ෆ්‍රීඩ්මාන්, ප්‍රැන්සිස් ෆුකියාමා වැනි අය ප්‍රධාන වෙති. මේ අදහස් ක්‍රියාත්මක කළවුන් අතර ඇමරිකානු ජනාධිපති රොනල්ඩ් රේගන් හා බ්‍රිතාන්‍ය අගමැතිනි මාග්‍රට් තැචර් පෙන්වා දිය හැකි ය.

කාලීන සමාජ අවශ්‍යතා මත ඇතිවන ගැටලු නිරාකරණය ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක වගකීමයි.

**රාජ්‍ය ව්‍යවසායකත්වය තුළ වර්ධනය වෙමින් පැවති අකාර්යක්ෂමතාව මඟින් ඇති වූ භාණ්ඩ හිඟය හා මිල ඉහළ යාම නිසා ඇති වූ ජනතා විරෝධතා හා නැඟී සිටීම්වලට විසඳුම් ලෙස ඉදිරිපත් කළ වෙළෙඳ පොළ ආර්ථිකය පිළිබඳ මතවාදය නව ලිබරල්වාදයයි.**


### ක්‍රියාකාරකම් 1.10

සමාජ තත්ත්වය වෙනස් වන විට රාජ්‍යයේ කාර්යභාරය ද ඒ අනුව වෙනස් වන ආකාරය සාකච්ඡා කරන්න. එහිදී පහත සඳහන් අවස්ථා කෙරෙහි අවධානය යොමු කරන්න.

- රාජ්‍ය නිර්බාධවාදය සමාජය තුළ ක්‍රියාත්මක වීම.
- සුභසාධනයේ අවශ්‍යතාව මතු වීම.
- වෙළෙඳ පොළ ආර්ථිකය බිහි වීම.

## 1.9 ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක වැදගත්කම

ප්‍රජාතන්ත්‍රවාදය ලොව පවත්නා පාලන ක්‍රම අතරින් වඩාත් මානව හිතවාදී පාලන ක්‍රමයයි. මානව වර්ගයාට ලබාගත හැකි උසස් ම යහපත ළඟා කරගත හැකි වන්නේ ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමය තුළිනි.



මානවයකු ලෙස ලද හැකි උසස් ම නිදහස හා යහපත ළඟා කර දෙන ආණ්ඩුක්‍රමය ප්‍රජාතන්ත්‍රවාදයයි.

**ක්‍රියාකාරකම් 1.11**

- ගුරුතුමාගේ/ගුරුතුමියගේ උපදෙස් අනුව ශ්‍රී ලංකාවේ පාලන ක්‍රමය තුළ පවත්නා ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ උදාහරණ සහිත ව දක්වන්න.

## 1.10 ප්‍රජාතන්ත්‍රවාදයට එල්ල වන අභියෝග

"ප්‍රජාතන්ත්‍රවාදය" බොහෝ දුරට සංකල්පමය පදනමක පවතී. එම නිසා ලොව කිසි ම රටක නිම කළා වූ ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් දැකිය නො හැකි ය. ප්‍රජාතන්ත්‍රවාදය ජනිත විය යුත්තේ මිනිස් සිත් සතන් තුළ ය. එම නිසා අප විසින් ප්‍රජාතන්ත්‍රවාදයේ මූලික කරුණු පෝෂණය කරමින් වර්ධනය කළ යුතු ය. ප්‍රායෝගික ක්ෂේත්‍රයේ දී ප්‍රජාතන්ත්‍රවාදයට එරෙහි අභියෝග ජයගත හැකි වන්නේ එවිට ය.

ප්‍රජාතන්ත්‍රවාදයට එල්ල වී ඇති අභියෝග කිහිපයක් පහත දැක්වේ.

- වෘත්තීය දේශපාලන පන්තියක් බිහි වීම.
- අධික ජනගහන වර්ධනය නිසා ප්‍රජා කාර්යභාරය පුළුල් වීමෙන් සංකීර්ණ සමාජ, ආර්ථික, දේශපාලන හා සංස්කෘතික ගැටලු උද්ගත වීම.
- ප්‍රජාතන්ත්‍රවාදී නිදහස මත මාධ්‍ය ආයතන ව්‍යාපාරගත වීම නිසා ජනතාවට නිවැරදි තොරතුරු ලබාගැනීමට බාධා ඇති වීම.
- කලින් කල පවත්වන මැතිවරණ නිදහස් ව හා සාධාරණ ව පැවැත්වීමේ දුෂ්කර බව.
- අසීමිත වූ නිදහස නිසා ඇති වන තරගකාරී ව්‍යාපාරික ඉඩ ප්‍රස්තාවන් නිසා ගැටලු මතු වීම.

**ක්‍රියාකාරකම් 1.12**

1. ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ වැඩි ගණනක් ප්‍රායෝගික ව ක්‍රියාත්මක වන රටවල් ලැයිස්තුවක් සකස් කරන්න. ඔබ එම රටවල් තෝරා ගැනීමට හේතු දක්වන්න.
2. ප්‍රජාතන්ත්‍රවාදී රටක ජීවත්වන පුරවැසියකු වශයෙන් ඔබ භුක්ති විඳින අයිතිවාසිකම් ඔබේ ජීවිතය යහපත් කර ගැනීමට හේතුවන ආකාරය විස්තර කරන්න.
3. ශ්‍රී ලංකාව තුළ ප්‍රජාතන්ත්‍රවාදය බොහෝදුරට සාර්ථක ව ක්‍රියාත්මක වීමට බලපා ඇති සාධක නම් කර, ඒවා නිදසුන් දක්වමින් පැහැදිලි කරන්න.
4. ප්‍රජාතන්ත්‍රවාදී රටක පුරවැසියකු විසින් ප්‍රගුණ කළ යුතු ගුණාංග ඇතුළත් ලේඛනයක් සකස් කර පන්තියේ ප්‍රදර්ශනය කරන්න.